# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

105 - 5th Lane, Colombo - 03, Sri Lanka
Tel: +94 11 2564404, Fax: +94 11 4722632
E-mail: cmev@cpalanka.org Website: http://cmev.wordpress.com


## දකුණු පළාත් සභා ඡන්ද විමසීම - 2009

### මාධ්‍ය නිවේදනය - අංක 05

2009- ඔක්තෝබර් 06

**2009 ඔක්තෝබර් 6 කොළඹදීය,** CMEV ක්ෂේත්‍ර නිරීක්ෂණ වාර්තා වලට අනුව දකුණු පළාත් සභා මැතිවරණයට අදාලව සමස්ත ප්‍රචණ්ඩ ක්‍රියාවන් සංඛ්‍යාව 73 කි. මෙම සිදුවීම් අතරින් 19 ක් බරපතල සිදුවීම් ලෙස ද, 54 ක් බරපතල නොවන සිදුවීම් ලෙස ද වර්ගීකරණය කර ඇත. බරපතල සිදුවීම් 19 අතරින් සිදුවීම් 11ක් ගාල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර සමස්ත සිදුවීම් 73 න් 29 වාර්තා වී ඇත්තේ ද එම දිස්ත්‍රික්කයෙන්ම වේ. වැඩිම බරපතල සිදුවීම් ගණනක් වාර්තා වන්නේ ගාල්ල දිස්ත්‍රික්කයේ හිනිදුම මැතිවරණ කොට්ඨාශයෙන් වන අතර මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය හා දෙනියාය මැතිවරණ කොට්ඨාශ වලින් ද බරපතල සිදුවීම් 2 බැගින් වාර්තා වේ. සමස්ථ සිදුවීම් අතරින් හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් 28 ක්ද මාතර දිස්ත්‍රික්කයෙන් 16 ක්ද වාර්තා වී ඇත .

**මාතර කඹුරුපිටියේ දී එ.ජා.ප. අපේක්ෂකයකුට පහරදීම**

2009 ඔක්තෝබර් 06 වන දින අලුයම 1.00 පමණ මාතර දළුගොඩ පාලම අසල දී ඩිපෙන්ඩර් රථ 2 කින් පැමිණි නොහාඳුනන පිරිසක් විසින් එ.ජා.ප. අපේක්ෂක උදය දිසානායක මහතා (මනාප අංක 09) වෙත ප්‍රහාරයක් එල්ල කර ඇත. පසුව ඔහුව මාතර මහ රෝහලේ වාට්ටු අංක 3 ට ඇතුලත් කර තිබේ.

CMEV ය විසින් දිසානායක මහතාගෙන් විමසූ විට ඔහු ප්‍රකාශ කරන ලද්දේ තමන් සතු ත්‍රීවිලර් රථයෙන් (200-2429) තිහගොඩ පිහිටි ඔහුගේ ඥතියකුගේ නිවසට යමින් සිටිය දී ඩිපෙන්ඩර් රථ 2 කින් පැමිණි නාඳුනන පිරිසක් විසින් ඔහුගේ මග අවහිර කරන ලද බවයි. එම කණ්ඩායම විසින් ඔහුට පොලුවලින් පහර දී ඇත. එසේම ඔහු සඳහන් කළේ මෙම ප්‍රහාර වලින් ඔහුගේ ත්‍රීවිල් රථයට ද අලාභහානි සිදුවී ඇති බවය. එසේම ඔහු තවදුරටත් ප්‍රකාශකරන ලද්දේ එම පහරදුන් පුද්ගලයන් පිස්තෝලයක් පෙන්වමින් මැතිවරණ ප්‍රචාරක කටයුතුවල නොයෙදෙන ලෙස තර්ජනය කල බවයි. මින් එක ඩිපෙන්ඩර් රථයක ලියාපදිංචි අංකය (WP KB 1927) ලෙස ඔහු විසින් හඳුනාගෙන ඇත.

මෙම සිදුවීම පිළිබඳව ප්‍රකාශයන් (EIB 31/51) යටතේ දිසානායක මහතාගෙන් හා ඔහුගේ රියදුරුගෙන් ලබාගෙන ඇති බව තිහගොඩ පොලිස් ස්ථානයේ උපපොලිස් පරීක්ෂක චන්දන අමරරත්න විසින් තහවුරු කරන ලදී. ඔහු තවදුරටත් CMEV ය වෙත ප්‍රකාශකරන ලද්දේ හඳුනාගත් වාහන අංකය මෝටර් රථ දෙපාර්තුමේන්තුව වෙත අනන්‍යතාවය දැන ගැනීම සඳහා යොමුකර ඇති අතර වැඩිදුර පරීක්ෂණ තිහගොඩ පොලිස් ස්ථානය විසින් මෙහෙයවන බවත්ය.

2009 ඔක්තෝබර් 06 වන දින CMEV ක්ෂේත්‍ර නිරීක්ෂක මාතර මහ රෝහල වෙත ගොස් තුවාලකරුගෙන් ප්‍රකාශ ලබාගෙන ඇත. මෙදින ප්‍රකාශ ලබාදීමෙන් අනතුරුව ඔහු රෝහලෙන් පිටව ගොස් ඇත.

**තිස්සමහාරාමය- ජ.වි.පෙ කාර්යාලයට පහර දීම**

එ.ජ.නි.ස ආධාරකරුවන් විසින් දෙබරවැව පිහිටි ජ.වි.පෙ අපේක්ෂක එල්.කේ. සංජීව ප්‍රියංක (මනාප අංක 3) ගේ පක්ෂකාර්යාලයට 2009 ඔක්තෝබර් 05 වන දින අලුයම 3.30 ට පමණ ප්‍රහාරයක් එල්ල වී ඇති බව

CMEV වෙත වාර්තා වී ඇත. CMEV ක්ෂේත්‍ර නිරීක්ෂකයා විසින් එම ස්ථානයට ගොස් එල්. කේ. සංජීව ප්‍රියංක හමුවූ විට ඔහු සඳහන් කළේ තිස්සමහාරාම පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් සටහන් කර ඇති බවයි. (EIB 96/6) තිස්සමහාරාම පොලිසියේ ජී. විජේසේකර CMEV වෙත දන්වා සිටියේ අංක (BR/755/2009) යටතේ අධිකරණට ඉදිරිපත් කිරීමට සූදානම් කර ඇති බවත් විමර්ශන කටයුතු තවමත් පවත්වන බවත්ය.

දකුණු පළාතේ දිස්ත්‍රික්ක 3 න්ම මැතිවරණයට අදාල ප්‍රචණ්ඩ ක්‍රියාවන් ඉහල යන බව CMEV ක්ෂේත්‍ර නිරීක්ෂකයන්ගේ වාර්තා වලට අනුව පෙනී යයි. මෙම පවතින වාතාවරණය ඡන්ද විමසීමට බලපෑමක් ඇතිවන බව CMEV ය දැඩිලෙස අවධාරණය කරයි. දකුණු පළාත තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහාත් මැතිවරණ දිනයේදී බාධාවකින් තොරව ඡන්ද විමසීම පැවැත්වීම සඳහාත් අවශ්‍ය පියවර අප්‍රමාදව ගන්නා ලෙස සියළු දේශපාලන පක්ෂ, මැතිවරණ කොමසාරිස් හා අදාල පොලිස් නිළධාරීන්ගෙන් CMEV ය දැඩි ලෙස ඉල්ලා සිටී.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය [CMEV] 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි වූ සන්ධානය එකතුව මැතිවරණය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය ඇති වීම නිරීක්ෂණය සඳහා පිහිටුවා ගත් ස්වාධීන හා අපක්ෂපාතී සංවිධානයකි. දැනට මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය INFORM මානව හිමිකම් පිළිබඳ දත්ත කේන්ද්‍රය යන සංවිධාන වලින් සමන්විත වේ.

නීතිඥ තුසිත සිරිවර්ධන
ජාතික සම්බන්ධිකාරක

0717019730